කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

---

No SF-2024-07-T


## වර්ෂ 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා උෂ්ණත්වය පිළිබඳ අනාවැකිය


**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඍතුමය අනාවැකිකරන අංශය මගින් 2024 ජූලි 04 වන දින නිකුත් කරන ලදී.**

---

## 2024 ජූලි මාසය සඳහා උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය

2024 ජූලි මාසය සඳහා ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය පහත දැක්වෙන පරිදි වේ.






**රූපය 01:** උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) **රූපය 02:** අවම උෂ්ණත්වය( රාත්‍රී කාලයේ)


රූපය 01: හි 2024 ජූලි මාසය තුළ ශ්‍රී ලංකාවේ උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2024 ජූලි මාසයේදී මන්නාරම, වව්නියාව, අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල, කොළඹ, ගම්පහ, රත්නපුරය, ගාල්ල, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල උපරිම උෂ්ණත්වය(දහවල් කාලයේ) සාමාන්‍යයට වඩා මදක් **ඉහල යාමේ** හැකියාවක් ඇති අතර බදුල්ල සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල උපරිම උෂ්ණත්වය මදක් පහල යාමේ හැකියවක් පවතී.


රූපය 02: හි 2024 ජූලි මාසය තුළ ශ්‍රී ලංකාවේ අවම උෂ්ණත්වය(රාත්‍රී කාලයේ) සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. . ඒ අනුව, 2024 ජූලි මාසය සඳහා කුරුණෑගල, පුත්තලම, මන්නාරම, අනුරාධපුරය, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය, බදුල්ල සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයට වඩා **ඉහල** යාමේ හැකියාවක් ඇති අතර

වව්නියාව, ත්‍රිකුණාමලය සහ අම්පාර යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයට වඩා මදක් පහල යාමේ හැකියවක් පවතී.

## 2024 ජූලි- සැප්තැම්බර් දක්වා උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය

2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය සඳහා ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය පහත දැක්වෙන පරිදි වේ.






රූපය **03:** උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) රූපය **04:** අවම උෂ්ණත්වය( රාත්‍රී කාලයේ)

රූපය 03: හි 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ උපරිම උෂ්ණත්වය සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල මන්නාරම, අනුරාධපුරය, කුරුණෑගල, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය, බදුල්ල, ත්‍රිකුණාමලය සහ අම්පාර යන දිස්ත්‍රික්ක වල දිගුකාලීන සාමාන්‍යයය උපරිම උෂ්ණත්වයට වඩා මදක් උෂ්ණත්වය **ඉහල** යාමේ හැකියාවක් පවතී.

රූපය 04: හි 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ අවම උෂ්ණත්වය සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල මන්නාරම, අනුරාධපුරය, පුත්තලම, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, මහනුවර, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයය අවම උෂ්ණත්වයට වඩා මදක් ඉහල යාමේ හැකියාවක් ඇති අතර වව්නියාව, කුරුණෑගල, ත්‍රිකුණාමලය, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයය අවම උෂ්ණත්වයට වඩා මදක් පහල යාමේ හැකියාවක් පවතී.

**සටහන: දිගුකාලීන දේශගුණික දත්ත නොමැති වීම හේතුවෙන් කෑගල්ල, මාතර, මාතලේ, මුලතිවු, කිලිනොච්චි, පොලොන්නරුව, මොනරාගල, යාපනය සහ කළුතර යන දිස්ත්‍රික්ක සඳහා උෂ්ණත්ව අනාවැකි මෙහි ඇතුළත් නොවේ.**